**ලංකා සතොස ලිමිටඩ් වෙත ගෙවීමේ පදනම මත වාහන ලබා ගැනීම සඳහා**
**සැපයුම්කරුවන් ලියාපදිංචි කරගැනීම. – 2019**
**පොදු උපදෙස්, නියමයන් හා කොන්දේසි**

1. සැමවිටම නිවැරදි තොරතුරු පමණක් සපයන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. සපයා ඇති කවර හෝ තොරතුරක් සාවද්‍ය බවට හෝ කවර හෝ වැදගත් තොතුරක් ලබාදීමෙන් වැලකී සිටින බවට පෙනී යන්නේ නම් එවැනි අයදුම්කරුවකු ලියා පදිංචි වීම සඳහා සුදුසුකම් නොලබනු ඇත. අසම්පූර්ණ හෝ අපැහැදිලි අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
2. අයදුම්පතට ඇමිණිය යුතු සියලු ලිපි ලේඛන අනුක්‍රමිකව අංකනය කළයුතුය.
3. ප්‍රශ්නයක් ඉදිරියෙහි ඊට උචිත ආකාරයට ‘‘ ඔව්/ නැත ’’ යන්න, පැහැර හැරීමකින් තොරව කපා දමන්න.
4. කරුණාකර අයදුම්කරුට අදාළ නොවන කවර හෝ ප්‍රකාශයක් ඉදිරියෙන් “අදාළ නොවේ” යන්න සඳහන් කරන්න.
5. ලියාපදිංචි කිරීමෙන් පසුව යම් සමාගමක තැපැල් ලිපිනයෙහි යම් සංශෝධනයක් හෝ වෙනසක් සිදු වුවහොත්, එම ඉල්ලීම සළකා බලනු ලබනුයේ, එම ඉල්ලීම සමග එකී සංශෝධනයට සම්බන්ධ අදාළ සමාගම මගින් නිකුත් කරන ලද සංශෝධිත සහතිකයෙහි සත්‍ය පිටපතක් ඉදිරිපත් කිරීමෙන් පමණි.
6. ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් එක් අයදුම්කරුවෙකුගෙන්, රු. 20,000/- ක (රුපියල් විසි දහසකි) අය කරනු ලැබේ.
7. ලියාපදිංචි කිරීමේ ගාස්තු සහ කාණ්ඩ ගාස්තු **ලංකා සතොස** ප්‍රධාන කාර්යාලයෙහි, 3වන මහලෙහි ස්ථාපිත මුදල් අංශයෙහි ගණකාධිකාරී වෙත ගෙවිය යුතුය.
8. ලියාපදිංචි ගාස්තු ගෙවන ලද මුදල් තැන්පතු පත්‍රිකාවේ නිල් පැහැති පිටපත අනිවාර්යයෙන් ඇමිණිය යුතුය.
9. ලංකා සතොස ලිමිටඩ් වෙළඳසැල් ජාලයෙහි අලෙවි කටයුතු කිරීම වෙනුවෙන් කුළු බඩු, ග්‍රොසරි භාණ්ඩ සහ උපකරණ ප්‍රවාහනය කිරීම පිණිස පහත සඳහන් බර පන්ති වල ලොරි රථ, කුලී ගෙවීමේ පදනම මත ලබා ගැනීම සඳහා මුද්‍රා තබන ලද අයදුම්පත් ලබා දිය යුතුය.

**ලොරි රථ - ටොන් 1 (ඩීසල්).**
**ලොරි රථ - ටොන් 2 (ඩීසල්).**
**ලොරි රථ - ටොන් 3 (ඩීසල්).**
**ලොරි රථ - ටොන් 4 (ඩීසල්).**
**ලොරි රථ - ටොන් 5 (ඩීසල්).**
**ලොරි රථ - ටොන් 10 (ඩීසල්).**
**ලොරි රථ - ටොන් 15 (ඩීසල්).**
**ලොරි රථ - ටොන් 20 (ඩීසල්).**
**ලොරි රථ - ටොන් 25 (ඩීසල්).**

<u>කොන්දේසි</u>

- නිෂ්පාදිත වර්ෂය 2007 නොඉක්මවූ, පිටුපස අගුලුදමා වැසිය හැකි දොරවල් සමග, ආරක්ෂිත සම්පූර්ණ බොඩිය සහිත (Full Body), මනා කාර්මික හා ක්‍රියාකාරී තත්වයෙන් යුතු, ධාවනයට සුදුසු ටයර් යෙදූ, සලාක ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට සුදුසු පිරිසිදු තත්වයෙන් යුතු වාහන විය යුතුය.
- සියළුම වර්ගයේ වාහන සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමේදී, දිනකට ධාවනය කල යුතු කි.මී. ප්‍රමාණය කි.මී. 3000 ක් සඳහා (උපරිම) සහ අමතර කි.මී. 01 ක් සඳහා මිල ගණන් ඉදිරිපත් කල යුතුය.
- ඉදිරිපත් කරනු ලබන මිල ගණන් 2019 දෙසැම්බර් 31 දින දක්වා වලංගු විය යුතුය.
- සේවාවන් කෙටි කාලීන ණය පදනම මත ඉටු කිරීමට කැමති විය යුතුය.
- වාහන වෙනුවෙන් ආරක්ෂිත, අත්තිකාරම් හෝ වෙනත් අයුරක මුදලක් **ලංකා සතොස ලිමිටඩ්** විසින් ගෙවනු නොලැබේ.
- හොඳ තත්වයෙන් යුතු අමතර රෝදය/ජැක්/වීල් බ්‍රෂ්/ආම්පන්න තිබිය යුතුය.
- ධාවනය සඳහා ඉන්ධන සැපයීම සැපයුම්කරු විසින් කල යුතුය.
- සියළුම වාහන රියදුරන් සහිතව ලබා දිය යුතු අතර, අදාල වාහන පන්තිය ධාවනය කිරීම සඳහා වලංගු බලපත්‍රයක් රියදුරු සතුව තිබිය යුතුය.
- වාහන ධාවනයේදී හෝ ධාවනයේ නොයොදවා ඇති විටකදී, ආපදා තත්වයකට/ක්‍රියා විරහිත තත්යවයකට පත් වූ විටකදී, සැපයුම්කරු විසින් ඒ හා සමාන සුදුසු වාහනයක් පැය 24ක් ඇතුලත ලබා දිය යුතුය. ආපදා තත්වයකට/ක්‍රියා විරහිත තත්යවයකට පත් වාහානයෙහි ඉදිරි පාලන කටයුතු සැපයුම්කරු විසින් සිදු කර ගත යුතුය.
- සියළුම වාහන සඳහා පූර්ණ රක්ෂණය / ලියාපදිංචිය / ආදායම් බල පත්‍රය තිබිය යුතු අතර වාහනය සමග එම ලියකියවිලිද ඉදිරිපත් කල යුතුය.
- සපයනු ලබන වාහන ලංකා සතොස ලිමිටඩ් විසින් නම් කරනු ලබන කාර්මික නිලධාරියෙකු විසින් පරීක්ෂාකොට අනුමත කිරීමකට යටත් වන්නේය. ප්‍රතික්ෂේප වන වාහන සැපයුම්කරු විසින් තමාගේ වියදමින් නැවත රැගෙන යා යුතුය.
- වාහන වල අළුත් වැඩියාවන් / රිය අනතුරු වල අළුත් වැඩියාවන් / සේවාවන් සහ ඊට අදාල නඩත්තු කටයුතු සුපයුම්කරු විසින් ඉටු කර දිය යුතුය.
- රිය අනතුරු, ස්වභාවික / අස්වාභාවික විපත් හේතුවෙන් වාහන වලට සිදුවන අලාභහානි සඳහා ලංකා සතොස ලිමිටඩ් වග කියනු නොලැබේ.
- ඇණවුමේ සිට පැය 24 ක උපරිම කාලයක් තුල වාහන සැපයිය යුතු අතර ඇණවුම දැණුම් දුන් පසු සේවාව ලබා දීමට නොහැකි නම් පැය 24 ක් ඇතුලත ඒ බව ලිඛිතව දැනුම් දිය යුතුය.
- ගෙවීම් කිරීම සඳහා සකසන ලද බිල්පත්, **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්), අංක 27, සතොස ලේකම් කාර්යාලය, වොක්ෂෝල් වීදිය, කොළඹ 02** යන ලිපිනයට යොමු කල යුතුය. වාහානය සැපයූ දින සිට මුදවා හරින දින දක්වා කාලයට (එම දෙදින ඇතුලත්ව) ගෙවීම් කරනු ලැබේ. ආපදා / අළුත් වැඩියා හේතුවෙන් ධාවනයෙන් ඉවත් කරනු ලබන දිනයන් සඳහා ගෙවීම් කරනු නොලැබේ.
- අයදුම්පත් **ලංකා සතොස ලිමිටඩ්** විසින් පත් කරන ලද කමිටුවක් විසින් ඇගයීමකට භාජනය කිරීමෙන් පසු තෝරාගනු ලබන සැපයුම්කරුවන්, 2019 වසර සඳහා **ලංකා සතොස ලිමිටඩ් වෙත කුලී** ගෙවීමේ පදනම මත වාහන සැපයීම සඳහා ලියාපදිංචි කරගනු ලැබේ.
- **ලංකා සතොස ලිමිටඩ්** වෙත කුලී ගෙවීමේ පදනම මත වාහන ලබා ගැනීමේදී ගුණාත්මක බව හා මිල යන ප්‍රධාන කරුණු පදනම්ව වාහන ලබා ගැනීම හෝ ලබා නොගැනීමේ අවසාන තීරණය සභාපති, ලංකා සතොස ලිමිටඩ් සතු වේ.

මුද්‍රා තබා ඉදිරිපත් කරනු ලබන මිල ගණන් පහත සඳහන් අයදුම්පත අනුව පිළියෙල කර **3 වන මහල, මිල දී ගැනීම් අංශය, ලංකා සතොස ලිමිටඩ්, අංක 27, සතොස ලේකම් කාර්යාලය, වොක්ෂෝල් වීදිය, කොළඹ 02** යන ලිපිනයට 2018.12.31 වන දින හෝ ඊට ප්‍රථම අතින් ගෙනැවිත් භාර දිය හැකිය.

අයදුම්කරුගේ යම් ප්‍රමාද දෝෂයක් හෝ අනවධානය සම්බන්ධයෙන් **වෙළඳ, පාරිභෝගික, සමූපකාර සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය / ලංකා සතොස ලිමිටඩ්** වග කීම භාර ගනු නොලැබේ.

වැඩි විස්තර අවශ්‍යනම් පහත සඳහන් නිලධාරීයා අමතා ලබා ගත හැක;

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මිල දී ගැනීම්)**
**දු.ක. -** 011- 2307526 **ජංගම - 070 3611133**

**සභාපති**
ලංකා සතොස ලිමිටඩ්,
අංක 27, සතොස ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

# ලංකා සතොස ලිමිටඩ් වෙත ගෙවීමේ පදනම මත වාහන ලබා ගැනීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කරගැනීම - 2019

## <u>අයදුම්පත</u>

| |
|---|
| **Application No;**<br>(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා) |

1. සැපයුම් කරුගේ/ආයතනයේ නම
   ..........................................................................................................................................................
2. ජාතික හැඳුනුම්පත් අංකය/ආයතනය ලියාපදිංචි අංකය
   ..........................................................................................................................................................
3. ලිපිනය
   ..........................................................................................................................................................
4. දුරකථන අංක: .......................................................... ජංගම: ........................................................
5. ලබාදිය හැකි වාහන සංඛ්‍යාව
6. <u>වාහන පිළිබඳ විස්තර (ඇමුණුම බලන්න)</u>

ලංකා සතොස ලිමිටඩ් වෙළඳසැල් ජාලයෙහි අලෙවි කටයුතු කිරීම වෙනුවෙන් කුළු බඩු, ග්‍රොසරි භාණ්ඩ සහ උපකරණ ප්‍රවාහනය කිරීම පිණිස ධාවනයේ යෙදවීම සඳහා, කුලී ගෙවීමේ පදනම මත වාහන ලබා ගැනීම වෙනුවෙන් ඉහත කොන්දේසි වලට එකඟ වන අතර මා හට / අප ආයතනයට හිමි ඉහත සඳහන් වාහනය, දක්වා ඇති මිල ගණන් යටතේ , කුලී ගෙවීමේ පදනම මත ලංකා සතොස ලිමිටඩ් වෙත ලබා දීමට එකඟ වෙමි.

..........................................
අයිතිකරුගේ අත්සන
දිනය**.................................... (නිල මුද්‍රාව තබන්න)**

---

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

Date Received :- ……………………. 2018 Srl No.: LSL/REG/LORRIES/ 2019/……

**Approved / Not Approved**

If **not approved** state condition of the Application ;
* Incomplete Application Yes / No * Insufficient Data Yes / No

**Chief Executive Officer – LSL**

**ඇමුණුම 01**

**සැපයුම්කරුගේ නම .........................................................**

| # | බර පන්තිය | වර්ගය | මාදිලිය | ඉදිරි ආසන සංඛ්‍යාව (රියදුරු හැර) | නිෂ්පාදිත වර්ෂය | සිලින්ඩර් ධාරිතාව | ඉන්ධන වර්ගය | වාහන ලබාදිය හැකි පලාත/ප්‍රදේශය | දිනකට කි.මී. 3000ක් ධාවනය කිරීම සඳහා අය කරන මුදල | අමතර කි.මී. 1ක් ධාවනය කිරීම සඳහා අය කරන මුදල | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |